දිවි තොර කරගැනීම් සම්බන්ධ පුවත් සමඟින් මානසික සෞඛ්‍ය උපකාරක අංක පළ කිරීමේ වැදගත්කම Ethics Eye අපි නිරතුරුවම අවධාරණය කරන්නෙමු. මානසික සෞඛ්‍ය ගැටලුවකට මුහුණ පෑමේ ප්‍රතිඵලයක් ලෙස කෙනෙක් දිවි හානි කරගැනීමේ පෙළඹවීමකින් සිටින්නේ නම්, එවැනි අයෙකුට හදිසි උපකාරක අංක හරහා උපදේශනය ලබාගෙන, එම පෙළඹවීමෙන් මිදීමට අත්වැලක් ලැබෙනු ඇත.

The Morning පුවත්පතෙහි (11/23) දිවි තොර කරගැනීම් පිළිබඳ පර්යේෂණ තොරතුරු ඇතුළත් ලිපියක් පළ වී තිබිණි.

1) එම ලිපිය තුළ දිවි තොර කරගැනීමේ ආකාර සම්බන්ධ සංවේදී තොරතුරු ඇතුළත් වූ හෙයින්, ලිපිය අවසානයේ හදිසි උපකාරක අංක කිහිපයක්ම සඳහන් කිරීමට පුවත්පත කල්පනාකාරී වී තිබිණි.

2) එසේම, දිවි තොර කරගැනීම අපරාධකාරී ක්‍රියාවක් ලෙසින් හඟවන "Committed suicide" වැනි යෙදුමක් වෙනුවට, දිවි තොර කරගැනීම් වාර්තාකරණය සම්බන්ධ මාර්ගෝපදේශ මගින්ද නිර්දේශ කොට ඇති "death by suicide" යන්න මෙම ලිපිය තුළ භාවිතා වී තිබිණි.

මින් පෙර කිහිප අවස්ථාවකද The Morning පුවත්පත වගකීම් සහගත ලෙසින් සිය ලිපි සමඟින් හදිසි උපකාරක අංක සඳහන් කර තිබූ බවද මෙහිදී සිහිපත් කළ යුතුයි. එය සැබවින්ම ප්‍රශංසා කටයුතු මාධ්‍යකරණයක් බව කිව යුතු වේ.

මෙම ආදර්ශය අනුව යමින්, අනෙකුත් මාධ්‍ය ද දිවි තොර කරගැනීම් හා සම්බන්ධ පුවත් හෝ ලිපි සමඟින් උපකාරක අංක පළ කිරීමේ සහ මාධ්‍ය ආචාර ධර්ම අනුගමනය කිරීමේ පුළුල් භාවිතයකට අවතීර්ණ වනු ඇතැයි Ethics Eye අපි උදක්ම බලාපොරොත්තු වෙමු.

හදිසි උපකාරක අංක:

*CCCline - 1333 *
*ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0112682535, 0112682570, 0112818860
**ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926 (දුරකථන ඇමතුම් හෝ කෙටි පණිවුඩ මාර්ගයෙන් සම්බන්ධ කරගත හැක) .

මූලාශ්‍ර:

https://apps.who.int/.../WHO-MSD-MER-17.5-eng.pdf... https://media.samaritans.org/.../Media_Guidelines_FINAL...